# මැඩිසා කුමරිය



ඒ.ජේ.එම්. ඔනිති සියන්සා අබේකෝන්

# මැඩිසා කුමරිය

ඒ.ජේ.එම්. ඔනිති සියන්සා අබේකෝන්

ප්‍රථම මුද්‍රණය : 2025.02.08

කර්තෘ : ඒ.ජේ.එම්.ඔනිති සියන්සා අබේකෝන්

ලිපිනය : නො.1/67,
ඉහළතැන්නේකුඹුර,
මහනුවර

ISBN අංකය : 978-624-208-262-2

මුද්‍රණය :
“PRESS”
නො.24, කොටුගොඩැල්ල වීදිය,
මහනුවර.

# පිදුම

කන්ද උඩරට සෙංකඩගල පුර ශ්‍රී දළදා

සමිඳු අභියස රැදෙන.......

මහමායා බාලිකා විදු පියසේ සිප් සතර

හදාරන මා.......

මාගේ ආදරණීය දෙමව්පියන් සහ

සිප්සතර ලබාදෙන මාගේ ආදරණීය

ගුරුැ මෑණිවරුැන්ට සහ පියවරුැන්ට,

මාගේ ආදරණීය සහෝදරියන්ට

මෙම පොත පිළිගන්වමි !

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂී සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිම්පාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"භෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකෝමත් එක දවසක හරි ලස්සන රටක් පාලනය කරන දැහැමි රජ පවුලක් ජීවත් වුණා.



රජ පවුලේ පුංචි කුමාරිකාව තමයි මැඩීසා. එයා හරිම ලස්සන කුමාරිකාවක්, ඒ වගේම හරි කරුණාවන්ත හිතකුත් තියෙනවා.


රජ වාසලේ හැමෝම මේ පවුලට ආදරය කළා.



හැබැයි, රජ පවුලට එරෙහිව වැඩ කරන සේවිකාවක් හිටියා. එයා හරිම මහත, කැත ගැහැණු කෙනෙක්.




ටිකෙන් ටික දවස් ගෙවිලා ගියා. එක දවසක් පුංචි මැඩීසගෙ අම්මට විස ශරීරගත වෙලා මිය ගියා.



මේ කතාව අහපු රටවැසියන් කම්පාවට පත් වුණා.

ඒ වගේද, මැඩීසා කෑවෙත් නෑ, බීවෙත් නෑ, එයා හැමවෙලේම ඇඬුවා.





එක දවසක ඇය මෙහෙම හිතුවා.

"මේක හරි පුදුමයක් මගෙ අම්මා නැති වුණේ නිකම් වෙන්න බෑ. මොකක් ම හරි හේතුවක් තියෙන්න ඕනි."

මැඩීසා තමාටම කියා ගත්තා.



එදා ඉදන් මැඩීසා තමන්ගේ අම්මා මිය ගියේ කොහොමද කියලා හොයන්න පටන් ගත්තා.

මැඩීසාට අර නපුරු සේවිකාව ගැන සැක හිතුනා. හැබැයි මැඩීසා සේවිකාවට එය පෙන්නුවේ නෑ.

එක දවසක් පුංචි කුමරිය
හොරෙන්ම අර සේවිකාවගේ
කාමරයට ගියා. ඇය කාමරය දිහා
විමසිල්ලෙන් බැලුවා.





සේවිකාවගේ ඇඳුමක් දොර පිටුපස එල්ලා තියනවා ඇය දැක්කා. ඒ ඇඳුමේ තිබුන ලියුම අතට ගත්තා.

එකේ මෙහෙමෙ තිබුණා.

"ඔන්න රජතුමනි, මේ රජ පවුලේ සතුට මම සදහටම නැති කළා....."



එය කියෙව්ව මැඩීසාගේ පුංචි නිල් පාට ඇස් දෙකෙන් කඳුළු ගැලුවා.



නපුරු සේවිකාව රැජිනව මරන්න කෑම වලට වස දැම්මා කියලා දැනගත්ත රාජ සභාව, සේවිකාවට මරණ දඬුවම නියම කළා.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට අල්බක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්නයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තරබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්.